


රනුත්මී රෙහන්සා ප්‍රේමරත්න

| | | |
|---|---|---|
| කෘතියේ නම | : | අද්භූත නිවස |
| කතෘගේ නම | : | රනුත්මි රෙහන්සා ප්‍රේමරත්න |
| | | මහාමායා බාලිකා විද්‍යාලය |
| | | 6 ශ්‍රේණිය G |
| කෘතිය පල කරන දිනය | : | 2025-02-08 |
| ISBN අංකය | : | 978-624-208-375-9 |

# පිදුම

**සෑම විටම කෙළි දොළට බර වූ සිතින්**

**මා හට කෙතරම් කරදර කළ ද**

**මා හට සැබෑ ආදරයක් දැක් වූ**

**මාගේ ම ආදරණීය මල්ලී හට**

**අදර සිතින්**

**පුද කරමි.**

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# අද්භූත නිවස

ජෙනී කියන්නේ අවුරුදු පහළොවක ගැහැණු ළමයෙකි. ඇගේ මව්පියන්ගේ අභාවය නිසා ඇය ජීවත්ව සිටි නිවස අතහැර ඇයට ජෙනක්ස් නැන්දණියගේ නිවසට යාමට සිදුවූයේ මීට අවුරුදු දහයකට පෙරයි. ජෙනෙක්ස් නැන්දා ඉතා කාරුණික තැනැත්තියකි. ඇගේ ප්‍රියතම නෑයා වූයේ ඇයයි. ඒ ඇය ජෙනී බැලීමට පැමිණි සෑම අවස්ථාවකම ඇය කැමතිම චොක්ලට් වර්ගය වන මෙරිගෝල්ඩ් රැගෙන ආ නිසයි.

ජෙනී ගේ හොඳම යහළුවන් තිදෙනා වූයේ ජැනට් බාර්බරා සහ පර්සි ය. මෙම මිතුරියන් සිව්දෙනා විසින් මිතුරු හවුලක් සාදාගෙන තිබූ අතර එහි නම වූයේ ‘සිව්දෙන හවුල’ යන්නයි. මොවුන් සෑම සෙනසුරාදා දිනකම සවස හතරේ සිට හය තෙක් මෙම රැස්වීම පවත්වන ලදී. සෑම දිනක ම ඔවුන් සියලු දෙනා රැස්වීමට සහභාගි වූයේ චොක්ලට් (මේරිගෝල්ඩ් ඇතුළුව) , ලෙමනේට්, කප් කේක් , ඩෝනට් මෙන්ම ඉඟුරු පාන්ද රැගෙනයන මොවුන් සිව් දෙනා මෙම සාකච්ඡාවේදී කතා වූයේ අතිශය බිහිසුණු කරුණක් වන අවතාර පිළිබඳවය.

.මෙහිදී ඔවුන් බ්ලඩීමේරි , කාසියේ භූතයා ඇතුළු සෑම හොල්මන් සෙල්ලමක්ම කරන ලදී. ඒ කිසිවක් ඔවුන් සිදු කළේ පර්සිගේ ගෙදර ගබඩා කාමරය වන ඔවුන්ගේ ‘සාකච්ඡා මධ්‍යස්ථානයේ’ දී නොවේ. ‘ටොරින්ටන්’ නම් සොහොන් බිමේදී ය. ඒ එහි හොල්මන් රැසක් සැරිසරන බවට ගැමියන් අතර විශ්වාසයක් වූ බැවිනි.

ජෙනක්ස් නැන්දාගේ නිවසට පැමිණ ටික කාලයක් ගතවත්ම ජෙනී ට රාත්‍රියේදී කිසියම් අද්භූත ශබ්ද , විලාප ඇහෙන්නට විය. මෙලෙස වූ පළමු දිනයේ දී පටන් මේ කියන්නට යන දින තෙක් ඇයට මෙම ශබ්දය ඇසීමට පටන් ගත් වේලේ පටන් ඇයට නිදියෑමට තියා ඇස් පියා ගැනීමටවත් හැකි වූයේ නැත. මෙම ශබ්ද සියල්ල ඇසීමට පෙර ඇයට අද්භූත හූ හඬවල් තුනක් ඇසෙයි. පළමු හූ හඬ ඇසෙත්ම ඇගේ සිරුරේ රෝම කූප කෙලින් වෙයි. කොතරම් සීතල රැයක වුවද සිහින් දහඩියක් ගලයි. කොඳු ඇට පෙළ හරහා විදුලි සැරයක් යන්නාක් මෙන් ඇයට දැනෙයි. දිනක් ඇය බොහෝ බිය වූවාය. මේ බියට පත් භාවය නිසාම ඇයට ජල පිපාසයක් සැදුණි. ඇගේ නිදන කාමරය තිබෙන්නේ උඩුමහලේ බැවිනුත්, කුස්සිය තිබෙන්නේ පහත මාලයේ බැවිනුත්, ඇය කුස්සියට ගොස් ජලය පානය කිරීමට බිය විය. ඒ , එම ශබ්ද සියල්ල පඩිපෙළ දෙසින් ඇසෙන්නට වූ බැවිනි . එදින ඇයට එක්වරම අද්භූත සයිරන් නලා හඬක් අසන්නට ලැබිණි. ඒත් සමඟ ම භයානක කටහඬක් සහිත ජීවියෙක් මෙසේ කියනු ඇසිනි. "උඹ මහා කාලකන්නියෙක් . උඹේ දෙමව්පියෝ උඹට ඉතිරි කර ගියා ගිය වළල්ල නොතිබෙන්න මම උඹව ඉතිරි කරන්නෑ. උඹ දන්නවද උඹේ දෙමව්පියන්ගේ මරණයේ සිදුවූයේ මගේ අතින් බව? ඒක උනේ කොහොමද කියලා උඹට දැනගන්න ඕනෙද ?අනික මම කවුද කියලත් දැන ගන්න ඕනෙ නම් උඹට කරන්න තියෙන්නේ උඹේ මරකත මැණික් වලින් හදපු වළල්ලත් අරගෙන 'ටොරින්ටන් 'සොහොන් බිමේ 1910 – 2000 අතර ජීවත් වූ අයගෙන් වම් පැත්තේ ඉඳලා දකුණට බැලුවොත් ජේන පළවෙනි සොහොන් කොත නෙමෙයි ඊට පස්සේ එක ළඟට හෙට මධ්‍යම රාත්‍රී දොළහට එන්න ඕනේ. නාවොත් උඹට මරණය නියතයි! ඇගේ ගත වෙව්ලන්නට විය මුළු ශරීරයම හිරිවැටී ගියේය මුහුණ සුදු මැළි විණි, උගුර කට වේලී ගියේ ය. රෝම කූප සියල්ලම කෙලින් විය. දහඩිය ගලන්නට විය. ඒත් සමගම තද වැහි කුණාටුවක් ආවේ ය. නමුත් ඒ ජෙන්ක්ස් නැන්දාගේ නිවසට පමණයි . ජනෙල් පියන් මහා ශබ්දයක් නංවමින් ඇරී වැසෙන්නට විය. ඒත් සමගම ඇයට වැසිකිළි යාමට වුවමනා

විය. නමුත් ඇය වැසිකිළිය දෙසට යාමට බිය විය. නමුත් ඇය බිය පසෙකලා වැසිකිළිය දෙසට පියමං කළා ය. එක්වරම ඇගේ පිටට කිසිවෙකු තට්ටු කරන ලෙස ඇයට දැනුණි. ඇගේ හදවත මොහොතකට නතර විණි. ඇය පිටුපස හැරී බැලුවා ය. කිසිවෙකු නොසිටි බැවින් ඇය නැවතත් ඉදිරියට හැරී බියෙන් බියෙන් ගමන් කළා ය. නැවතත් ඇගේ පිටට කිසිවෙකු තට්ටු කරන බව ඇයට දැනුණි. ඇය එක්වරම පිටුපස බැලූවා ය. එවිට ඇය හට කිසියම් අපැහැදිලි ඡායාවක් ඈතට ඇදී යන අයුරු පෙනුණි . ඇය ජෙන්ක්ස් නැන්දාට කොතරම් හඬ නගා කෑ ගැසුවත් ඇය නොවේ පැමිණියේ. . කෙසේ හෝ ඇය අවශ්‍යතාවය ඉටුකරගෙන නැවත කාමරයට පැමිණ දොර වසා ගත්තේ උදෑසන වන තුරු ඇඹිලි ගනිමිනි.

* *

* *

ළාහිරු කිරණ ඇගේ කාමරයට වැටෙත්ම අවදි වුනු ජෙනී ඉක්මනින්ම හැඳ පැළඳගෙන ඉක්මනින් පහළට දිව ගොස් ජෙන්ක්ස් නැන්දාහට අඬගැසුව මුදු ඇය පැමිණියේ නැති බැවින් ,ඇය මොහොතක් හෝ පමා නොවී පර්සිගේ නිවස දෙසට දිව්වේ පෙර දින රැයේ සිදුවූ අද්භූත සිදුවීම තම මිතුරන් හට දැන්වීම සඳහා රැස්වීමක් කැඳවීමටයි.

ජෙනී දිව ගොස් පර්සිගේ ගෙදර දොරට තට්ටු කරත්ම දොර හැරගෙන පැමිණියේ පර්සිගේ අම්මා ය. පෙර දින රැයේ සිදුවූ බිහිසුණු සිද්ධිය නිසා බිය වී සිටි ජෙනී සුදු මැළි වී සිටින දුටු පර්සිගේ අම්මා වන තැම්බලීනා මෙසේ කිව්වා ය .

"මොකද ළමයෝ මේ සුදු මැළි වෙලා ? ඉන්න මං කෝපි ටිකක් හදලා දෙන්නම්

ඒක බිව්වම ටිකක් ඔය සුදු මැලි ගතිය අඩුවෙලා යයි.

ඔයාට පර්සිවද හම්බෙන්න ඕනේ ? මං කෝපි එක හදනකම් ඔයා පර්සිත් එක්ක කතා කර කර ඉන්නකෝ.... ඉන්න , මං පර්සිට අඬගහන්නම්. පර්සි.... පර්සි... දුව මෙහෙ එන්නකෝ .....ජෙනී ඇවිත් ඔයාව හම්බෙන්න . “

″ඉන්න අම්මේ මං එනවා .....″

ඈ මට කෝපි පිළියෙල කිරීමට කුස්සියට ගියා ය.

“ ආ...ජෙනි...උදේම! “

″අනේ පර්සි ලොකු හදිස්සියක්. කට්ටිය ව කැඳවලා අද රැස්වීම තියමුද ? අනිත් එක අද සෙනසුරාදනේ. ඒ නිසා ඉස්කෝලේ යන්නත් නෑනේ.”

“ හරි හරි අපි රැස්වීම තියමු. ඔක්කොටම ඉස්සර වෙලා ඔයා මට කියන්නකෝ මොකක්ද ප්‍රශ්නේ කියලා. “ “ මම ඒක ඔයාට පස්සේ කියන්නම්. අනේ ඉක්මනට කට්ටියට ටෙලිෆෝන් කරලා කියන්නකෝ අද රැස්වීම තියෙනවා කියලා. අපි උදේ දහයට විතර පටන්ගෙන දොළහට හෝ ඊට පහුවෙලා ඉවර කරමු.” “ හරි, හරි, හැබැයි ඔයා මට පස්සෙ කියන්න ඕන හරිද? “

″හා හා..ඉක්මන් කරන්නකෝ″

පර්සි දිව ගොස් සියලු දෙනාගේම නිවසට ටෙලිෆෝන් ඇමතුම බැගින් අරගෙන අද රැස්වීම තියෙන බව පැවසුවා ය. ඊට පසුව ඇය ජෙනී වෙත ගොස් බැරෑරුම් පෙනුමක් ඇගේ මුහුණට ආරූඪ කරගෙන ජෙනීගෙන් සිදුවූයේ කුමක්දැයි විමසුවා ය. ජෙනී ඇයට මුළු සිද්ධියම විස්තර කළා ය.

මොහොතකින් පර්සී ගේ අම්මා ජෙනීට සහ පර්සිට කෝපි සාදාගෙන එතැනට පැමිණියා ය .

"ජෙනී, මොකද දුව අද මේ උදේ පාන්දර ? " කියා ඇසුවා ය . නමුත් ජෙනී පිළිතුරු දීමට සූදානම් වන විට, පර්සි මැදින් පැන "අනේ අම්මේ අපේ හවුලේ වැඩකට ; පස්සෙ කියන්නංකෝ" කීවා ය. ඉන් පසුව පර්සිගේ අම්මා සිනහ වී "හරි හරි, ඔයාලා එහෙනම් කතා කරගන්නකෝ " කියා නිශ්ශබ්ද වූවා ය. කෝපි පානය කරන විට ජෙනී ගේ සුදුමැලි පෙනුම අඩුවී කම්මුල් රත් පැහවන්නට පටන් ගත්තේය. . .

*　　　*

*　　　*

" පර්සි. . . . පර්සි. . . . . " ඒ බාර්බරාගේ හඬ ය. ඒත් සමඟ ම ජැනට්ගේ කටහඬද ඇසෙන්නට විය. "එන්න, එන්න, ඉක්මනට. වැය කරන්න කාලයක් නෑ. "

" හරි හරි මොකද වුණේ ? "දෙදෙනාම ඇසූහ.

" පස්සෙ කියන්නම්. ගබඩා කාමරයට යමුකෝ " පර්සි කීවා ය.

ඔවුන් ගබඩා කාමරය දෙසට ඇවිද ගියේ මීළඟට කුමක් වේදැයි සිතමිනි.

සියලු දෙනාම ගබඩා කාමරයට ඇතුළු වූ පසු පර්සි දොර වසා යතුරු දමා යතුර අතට ගත්තා ය.

“හරි දැන් අපිට කියන්නකො මොකද වුණේ කියල .” බාර්බරා කිව්වා ය.

“ හරි ;හරි; ඔහොම ඉන්න පොඩ්ඩක් කලබල නැතුව. ඔයාම කියන්නකෝ ජෙනී මොකක්ද අවුල කියලා.” පර්සි කීවා ය.

“මම කියන එකඑහෙනම් අහගන්නකෝ.....ඊයේ රෑ තමයි මේ සිද්ධිය වුණේ. ඊයේ රෑ කිව්වට ඊයේ වුණු දේවල් වලින් කොටසක් මේ ළඟක දී ඉඳලා හැමදාම වෙන ඒවා.”

“ ඉතින් ඇයි ඔයා අපට කිව්වේ නැත්තේ?” බාබරා ඇසුවා ය.

“මැට්ටි ඉන්නව කෝ මැදින් පයින්නේ නැතුව” ජැනට් කීවා ය.

“මමයැ ? ඔයානේ මැදින් පයින්නේ; නිකං අනම් මනං කියවන්නේ නැතුව ඉන්න....” බාර්බරා නෝක්කාඩු ස්වරයෙන් කීවා ය.

“ දෙන්නම කටවල් වහගන්න. ඔයාලට මේක අහගන්න ඕනේ නැද්ද ?” පර්සි කීවා ය.

“ ඕනේ...” දෙදෙනාම කීහ.

“ එහෙනම් ඉතින් ඔය හැකර කටවල් දෙක වහගන්න. ජෙනී ඔයා පටන් ගන්න.”

“මං කොතැනද කිය කිය හිටියේ...?”

“ කොටසක් ළඟකදී ඉඳලා.....”

“ ඒ ඇති ජැනට් : ආ.... මම කිව්වනේ ළඟකදී ඉඳලා හැමදාම ඊයේ වුණු දේවල්වලින් කොටසක් වුණා කියලා. ඔන්න මුලින්ම වෙන්න යන්නේ මොකක්ද දන්නවද ? භයානක හූ හඬවල් තුනක් ඇහෙනවා. ඊට පස්සේ අද්භූත සද්ද ඇහෙනවා. ඒ කියන්නේ මීයෝ දුවනවා, හයියෙන් හුලං හමනවා, කවුදෝ කෙනෙක් උඩ පනිනවා

වගේ සද්ද ; හැබැයි ඇත්තටම එහෙම දේවල් වෙන්නෙ නෑ. සද්ද විතරයි.

හරි' දැන් මං කියන්නංකෝ ඊයේ රෑ වුණු දේවල්. මතක් වෙනකොටත් ඇඟේ මයිල් කෙලින් වෙනවා. ආ..... කියන්න අමතක වුණානේ මේ ඔක්කොම සද්ද ඇහෙන්නේ පඩිපෙළ දිහාවෙන් කියලා. ඔන්න මං හිටපු තැනටම යන්නංකෝ...... ඔයාලා දන්නවනේ මගේ කාමරේ තියෙන්නේ උඩ තට්ටුවේ කියලා. ඒ වගේම කුසසිය තියෙන්නේ යට තට්ටුවේ කියලා. ඊයේ බය වුණු පාර මට වතුර තිබහක් හැදුනත්, මම බයේ කුස්සියට යන්නැතුව හිටියා. ඔන්න එකපාරටම අද්භූත බය හිතෙන සය්රන් නලා හඬක්. ඊට පස්සේ භයානක කටහඬක් මෙහෙම කියනවා ඇහුණා.

" උඹ මහා කාලකන්නියෙක්. උඹේ දෙමව්පියෝ උඹට ඉතිරි කර ගිය වලල්ල නොතිබෙන්න මම උඹව මරනවා. උඹ දන්නවද උඹේ දෙමවුපියන්ගේ මරණය සිදුවුණේ මගේ අතින් බව ? ඒක වුණේ කොහොමද කියලා උඹට දැනගන්න ඕනෙද ? අනික මම කවුද කියලත් ? උඹට කරන්න තියෙන්නේ උඹේ ඔය මරකද මැණික් වළල්ලත් අරගෙන 'ටොරින්ටන්' සොහොන් බිමේ 1910ත් 2000ත් අතර ජීවත් වූ අයගෙන් වම් පැත්තේ ඉඳලා දකුණට බැලුවොත් ජේන පළවෙනි සොහොන් කොත නෙමෙයි, ඊට පස්සේ එක ළඟට හෙට මධ්‍යම රාත්‍රී දොළහට එන්න ඕනේ. නාවොත් උඹට මරණය නියතයි. ! "

ඔහොම තමා ඇහුණේ.

මගේ අම්මෝ ඒක ඇහුනාම මට දැනුනු බය... "

"මේ ඒක නෙවෙයි. මට තියෙන ප්‍රශ්නේ ඔයා කොහොමද ඔච්චර දෙයක් මතක තියාගත්තේ කියලා .......ජැනට් කීවා ය.

“දැන් මැදින් පනින්නේ මමද ? ඔයාද ? බාර්බරා ප්‍රශ්න කළා ය.

“ හරි හරි දෙන්නම දෙන්නගේ ඔය කටවල් දෙක වහගන්නවද ?
“ඒ ජෙනී ය.

“හරි. හරි. “ජැනට් සහ බාරබරා අකැමැත්තෙන් එසේ කිවූහ.

“ ඔන්න එහෙනම් ඉතුරු ටික පටන් ගන්නවා. ඔන්න ඒත් එක්කම වැහි කුණාටුවක් ආවා. හැබැයි ජෙන්ක්ස් නැන්දලාගේ ගෙදරට විතරයි. ඊට පස්සේ ජනෙල් පියන් හයියෙන් ඇරුනා වැහුනා. බය උණු පාර මට ටොයිලට් එකටත් යන්න ඕනේ වුණා. වතුර තිබහ වගේද ඒක ඉතින්? මං බය පැත්තකට දාලා ටොයිලට් එකදිහාට යනකොට එකපාරටම කවුදෝ මගේ පිටට තට්ටු කළා. මං හැරිලා බැලුවා; කවුරුවත් හිටියේ නෑ. ආයේ මම යන්න ගත්තා. ආයෙත් කවුදෝ මගේ පිටට තට්ටු කළා. මං එකපාරටම හැරිලා බලනකොට මොකක් හරි අපැහැදිලි ඡායාවක් ඈතට ඇදිලා ගියා. මම ජෙන්ක්ස් නැන්දට කතා කළා, වැඩක් වුණේ නෑ. එයා ආවෙ නෑ. ඊට පස්සේ මට පුළුවන් තරම් හයියෙන් කාමරයට දුවලා දොරවහ ගත්තේ උදේ වෙනකන් නොඉවසිල්ලෙන්.

උදේ වුණු ගමන් මං පර්සිගේ ගෙදරට දුවගෙන ආවා. ජෙන්ස් නැන්දා මං හිතන්නේ අතුරුදන් වෙලා.

ඒකනේ මං කතා කරාට ආවේ නැත්තේ. මං ඉතින් උදේ එයා ආවේ නැති පාර හොය හොයා ඉන්නැතුව තමයි ආවේ. ”

“අද නේද සොහොනට යන්න තියෙන්නේ ? අපි ඔක්කොටම ඉස්සෙල්ලා ජෙන්ස් නැන්දව හොයා ගමු. ඒත් මට කියන්න ජෙනී මොකක්ද ඔයාගේ ඔය වළල්ල ? ඔයා දාගෙන ඉන්න එකද ? “

“ ඔව් පර්සි. අපි දැන් යමු නැන්දව හොයාගන්න. ඊට පස්සේ සොහොනට යන එක බලාගමු.” එසේ කීවේ ජෙනී ය.

“අම්මෝ මට නම් යන්නත් බයයි වගේ. . . . ” ඒ කිව්වේ බාර්බරා ය.

ඔයාට බැරි නම් අපි යන්නම් බයගුල්ලියෝ අපට ඕනේ නෑ ඒ ජැනට් ය.

″නෑ නෑ මම එනවාමයි ″ සිතට ධෛර්යය ගනිමින් බාබරා කීවා ය.

සියලු දෙනා ම නැගිට ඔවුන්ගේ රාක්කය වෙත ගොස් යම් හෙයකින් අනතුරක් සිදුවුවහොත් කියා ඔවුන්ටම වෙන් වූ කිණිසි සතර ගෙන ගැන ජෙන්ක්ස් නැන්දාගේ නිවසට ගියහ.

ඔවුන්ට නිවසට ළඟා වෙත්ම නිවස තුළින් ඉතා කටුක අප්‍රසන්න දුගඳක් හමනු දැනුණි.

“අප්පේ මොකක්ද මේ ගඳ ? ජෙනී , ඔයාලගේ ගෙදර කවදාවත් සුද්ද කරන්නේ නැද්ද ? “ එසේ නාසය වසා ගනිමින් ජැනට් කීවා ය.

“ ඊයේ රෑ . . . . . . . ආ; පොඩ්ඩක් ඉන්න. මං කිව්වෙ මට කවුරුහරි තට්ටු කරනවා දැනුනා කියලා. ඒ වෙලාවෙත් ඔය ගඳ ආවා. බය වුණු පාර මට ඒක වැඩිය ගානක් ගියේ නෑ. හැබැයි ආවෙ මෙච්චර ගඳ එකක් නෙවෙයි. මෙතනින් ලේ කුණු ගඳක් එනවන අනේ මට නම් බයයිත් වගේ. . ”

“බයවෙන්න එපා පිස්සි අපි ගාව කිණිසි තියෙනවනේ. . . . . මට හරි ආසයි මේක විසඳනකම්. ” ඒ පර්සි ය.

“ඒක තමයි “ ජැනට් අනුමත කළා ය.

“ හරි, හරි, කතාව නවත්තලා ඇතුලට යමුකෝ. . . . . ”

“අනේ ඉන්නවකො පොඩ්ඩක් ඉවසලා පර්සි. ” ජැනට් කෑ ගැසුවා ය.

පර්සි පය ඉක්මන් කර නිවස දෙසට පියමන් කළා ය. ඇය පසු පස අනෙක් තිදෙනාත් ගමන් කළහ.

සිව් දෙනාම න නිවසට ඇතුළු වූහ. ඉන්පසුව ඔවුහු ජෙන්ක්ස් නැන්දාගේ කාමරයට ගොස් දොර හැරිය පසු දුටු දෙයින් මහා බියකටත්, විමතියකටත් පත් වූහ . ක්වන්ධයක් කකුල් දෙකින් අල්ලා වහලේ සවි කර තිබූ විදුලි පංකාවේ එල්ලා තිබුණි ! කාමරය මැද තිබුණු බුමුතුරුණ ලෙයින් පෙඟී තිබුණි . ඔවුන් බියෙන් , බියෙන් , සෙමෙන් කාමරයට ඇතුළු වූහ.

“ මේක කාගේ ඔලුව නැති මිනියක් කියලද හිතෙන්නේ ජෙනී ?” වෙව්ලන හඬකින් යුතු ව මෙසේ ඇසුවේ බාර්බරා ය.

ඒත් සමගම ජෙන්ක්ස් නැන්දාගේ අල්මාරියේ දොර හැරී වැසුණේ ය. සියලු දෙනාගේම ශරීරවල රෝමෝද්ගමනය සිදුවුණේ ය.

ඉදිකටුවක් වැටෙන ශබ්දය ඇසෙන තරමට පරිසරයෙන් නිහඬ ය.

එම නිහඬතාවය බිඳ දැමුවේ ජෙනී ය. “මට හිතෙන්නේ මේක ජෙන්ක්ස් නැන්දාගේ. “ඇය හඬන්නට විය.

ජැනට් පුළුවන් තරම් ඉක්මනට පොලිසියට ටෙලිෆෝන් කරලා එන්න කියන්න. පර්සි අණ දෙන්නට පටන් ගත්තා ය.

“දැන් වෙලාව කීයද ? “ඒ බාර්බරා ය.

“අයියෝ! දැන් වෙලාව දවල් දොළහයි. අපිට වෙලාව මදි වෙයි. මරකත මැණික් වළල්ලත් අරන් සොහොන් බිමට යන්න තියෙනවනේ “පර්සි කැලඹී ගිය ස්වරෙන් කීවා ය.

මොහොතකින් පොලිස් ජීප් රථවල ශබ්දය ඇසුණි. සියලු දෙනාම පොලිසියේ මහත්වරු හමුවීම සඳහා නිවසින් පිටතට පැමිණියහ. “ කවුද මෙතනින් මළ සිරුරු අඳුරා ගත්තේ? “ එක් පොලිස් නිලධාරියෙක් මඳ සිනහවක් පාමින් ඇසුවේ ය.

“මි. . . මි. . මම. . ” ජෙනී කීවා ය.

“ හරියටම විශ්වාසද මේ ඔයාගේ නැන්දා කියලා ? “

“ඔව්. “

“හ්ම්. . යමුකෝ බලන්න. ”

නිවසට ඇතුළු වෙත්ම ඔහු දැ ණුනු දුගඳ නිසා තම නාසය වසාගත්තේ අප්රසන්න බව හඟවමිනි.

” මට කාමරයට යන පාර පෙන්වන්න.

ඔයාලා පොඩ්ඩක වටපිටාව පරීක්ෂා කර බලන්න. හෝඩුවාවක් තියෙන්න බැරි නෑ. ” ඔහු එසේ කීවේ සෙසු නිලධාරීන් හට ය.

ජෙනී ඉදිරිපත්වී පොලිස් නිලධාරියන් හට කාමරයට යාමට තිබෙන මග පෙන්වූවා ය.

පොලිස් නිලධාරියා දිස් වූ දර්ශනයෙන් විමතියට පත් වී මෙසේ කියන්නට විය. ” ඔය පුංචි නෝනලා මේක දැකලා කොහොම ඉන්නවද මන්දා? මේක හරිම බය හිතෙන දර්ශනයක්නේ. ”

* * * *

මේ අතර බාර්බරා ජැනට්ගේ අත මිරිකන්නට පටන් ගත්තා ය. .

උෟය් අත මිරිකන්නේ නැතුව ඉන්නවකෝ. . . . . . පොලිස් නිලධාරියාට නොඇසෙන සේ ඇය කන් කෙඳිරි ගෑවා ය.

“මට බයයි. “

බයයි නම් ඔයා මෙතන යන්න වද දෙන්නෙ නැතුව.

“ අපෝ මට නම් බෑ. ”

“එහෙනම් වද නොදී ඉන්න. ”

“හරි, ” හරි. බාර්බරා” පිළිතුරු දුන්නේ අසතුටෙනි.

* * * *

එය කියා අවසන් වනවාත් සමගම නැවතත් අල්මාරියේ දොර ඇරී වැසුනේ සියලු දෙනාවම බියට පත් කරමිනි. පොලිස් නිලධාරියා මොහොතක් ඒ දෙස ගල් ගැසී බලා සිට අල්මාරියේ දොර හැරීමට ඒ දෙසට ගියේ ය . එක්වරම අල්මාරියේ දොර ඇරුණි. දුටු දෙයින් මහත් භීතියකට පත් වූ ඔහු අඩියක් පිටුපසට පැන්නේ ය.

ජෙන්ක්ස් නැන්දාගේ හිස කොටස අල්මාරිය තුළ විය. එහි කෝපය , ද්වේෂය සහ භීතිය ඉතා හොඳින් සටහන්ව තිබුණි. එමෙන්ම මුහුණ රතු ලෙයින් පෙඟී තිබුණේ කාගේත් සිත්වල භීතිය සහ පිළිකුල උපදවමින් කිව්වොත් නිවැරදි ය .

සුළු දෙයටත් බියට පත්වන බාර්බරා එකවරම යටිගිරියෙන් බෙරිහන් දුන්නා ය.

“ හරි , හරි , ළමයෝ බයවෙන්න එපා. අපි ඉන්නවනේ. . . ” බාර්බරා සැනසවීමට පොලිස් නිලධාරියා එසේ කීවේ ය.

මොහොතකින් ප්‍රශ්න කිරීම ආරම්භ විය ප්‍රශ්න සියල්ලටම ජෙනී වෙව්ලන හඬකින් උත්තර දුන්න නමුත් මරකත වළල්ල පිළිබඳ වචනයකුදු නොපැවසීමට ඇය වග බලා ගත්තේ පර්සිගේ උපදෙස් මත ය. පොලිස් නිලධාරීහු පිටව ගියහ. ජෙනී පර්සිගේ ගෙදර එදින නවාතැන් ගත්තා ය.

*　　　　　　*　　　　　　*
*

ටොරින්ටන් සොහොන් බිමේදී නැවත සියලු දෙනා එක්වූහ. ඔවුනොවුන් හමු වී කතිකා කරගත් පරිදි සැවොම රිදී කුරුස ,කිනිසි හා ජෙනී ගේ වළල්ලද සහිත ව අවතාරය විසින් පවසන ලද සොහොන් කොත උඩට පැමිණි වෙලාව එනතුරු බලා සිටියහ.

එක්වරම මහලු කතකගේ වියරු වැටුණු අද්භූත කටහඬක් අසන්නට ලැබුණි. "හහ්. . . . හහ්. . . . . . හා. . . . . මට ඕන දේ ලැබුණා. හහ්. . . . . හහ්. . . . . හා. . . . . . . ජෙනී උඹ හහ්. . . . . . හ්හ්. . . . . . . හා. . . . . . . කටහඬ අඳුරන්න පුළුවන්ද හහ්. . . . . . හ්හ්. . . . . . . හා. . . . . . . "

" කවුද ඒ ? ඔයාගේ ආච්චි නේද ? "එසේ වෙව්ලමින් ඇසුවේ ජැනට් ය.

ජෙනී පිළිතුරු දීමට සූදානම් වුවද එයට පිළිතුරු දුන්නේ මහලු කත . ය" ඔව්. ඔව්. මම තමයි. හහ්. . . . . . හ්හ්. . . . . . . හා. . . . . . .

එක්වරම මීදුම් වලාවක් සමග මහලු කතගේ අවතාරය මතුවිණි. හහ්. . . . . . හ්හ්. . . . . . . හා. . . . . . . උඹ හහ්. . . . . . හ්හ්. . . . . . . හා. . . . . . . හරි මම කියන්නම්. මොනවද ? හහ්. . . . . . හ්හ්. . . . . . . හා. . . . . . . ඔක්කොම හහ්. . . . . . හ්හ්. . . . . . . හා. . . . . . . උඹේ දෙමව්පියෝ , උඹේ නැන්දා උදුරා ගත්තා. මොනවද ? සේරම. . . . . . . .

මගේ නිදහස, ඉඩකඩම් , මම උපයෝප්පු ධනය උන් ගත්තා. උන්ගෙන් මම පළි අරගෙන ඉවරයි. දැන් ඉතුරු උඹ! හරි හරි මම කියන්නම්; මුළු කතාවම කියන්නම් කරපු හැමදේම. . .

ඒ රාත්‍රිය සුළි කුණාටු හැමූ දවසක්. එදා මගේ බංගලාවේ ඔව් ඒක උඹේ නැන්දා මගෙන් උදුරා ගත්තා. හරි හරි හරි. . . මම ආපහු හිටපු තැනටම එන්නම්. ඔව්. එදා උපන්දින සාදයක් තිබුණා කාගෙද ? උඹේ. . .”

ජෙනීට සිය අතීත සිදුවීම් සමුදායක් චිත්‍රපටයක මෙන් සිය සිතේ මැවී පෙනෙන්නට විය. ඇයට ඇගේ අවුරුදු තුනේ උපන්දින සාදය දර්ශනය විය. කුණාටුවක් හැමූ සැටි එක්වරම කලබලයක් ඇති වී කවුරුන් හෝ ගින්නක් කියමින් කෑගසූ හැටි. . . . . !

* * * *

සියලුම සිදුවීම් නැතත් , මෙවැනි සිදුවීම් කීපයක් ඇගේ සිත් තුළ ශේෂවී තිබුණි.

එක්වරම ඇයට ඇගේ හිස කැරකෙන්නාක් මෙන් දැනුණි. ඇය කලාන්ත වූවා ය. නැහැ. ඇය කලාන්ත වූයේ නැත. නමුත් ඇයට සහ ඇගේ මිතුරියන්ගේ සිත් වලට එවැන්නක් අවතාරයේ විසින් කාවද්දා ඇත.

ඉහත කී සිදුවීම් පෙළ ඇගේ මිතුරියන් හටද එලෙසම දකින්නට ඉඩ හැර ඇත්තේ ද ක්ලාන්ත වූ හැඟීම ද ඇති කර ඇත්තේ ද අවතාරය විසිනුයි.

සිව් දෙනාටම ක්ලාන්ත වූ හැඟීමෙන් පසුව තමා ඇතට පාවී යන්නාක් මෙන් දැනී අඳුරු ලොවක අතරමං වී ඇති හැඟීමක් අවතාරය විසින් සිතට කාවද්දා ඇත.

ඔවුන්ගේ සිත් තුළ චිත්ත රූප ලෙස එදා සාදය සිදුවූ සිදුවීම් දර්ශනය වන්නට විය . එක්වරම ඔවුන් සාදය පැවති ස්ථානයේ සිට ජෙනී ගේ නිදන කාමරය පිහිටා ඇති තැනට වේගයෙන් පියමං කරන්නාක් දර්ශනය විය. නිදන කාමරයේ දොර හැරිණි. එක් එක් තැනැත්තාට වෙන වෙනම මේ සිදුවීම් දර්ශනය විය. තමන් එක්වරම කාමරයට ඇතුළු වූ හැඟීමක් ඔවුන්ට දැනුණි. දොර එක්වරම එක්වරමක වායස්ගත කාන්තාව පුටුවකට තබා බැඳ , කෑගැසීමට නොහැකි වන පරිදි මුව ද තදකර බැඳ තිබුණි.

නැවත ඔවුන් පියවි සිහියට පැමිණියහ.

*          *          *          *

"දැන් ජේනවද උඹට උන් මට සලකපු හැටි? ඒකට හේතුවක් වුණේ උඹ ඉපදුණු එකයි ! උන් මට උඹෙ අහලකටවත් ළංවීමටවත් ඉඩක් දුන්නේ නෑ. ඇයි? උඹ මට ආදරේ කරාවි කියා. එදා රාත්‍රියේ ඔවුන් මට කස පහර ලබාදී මගේ ගෙල සිරකර මා මරා දැමුවා. "

ඇයගේ මුහුණෙහි පෙනුම බැලීමට නොහැකි ආකාරයට බිහිසුණු පෙනුමකින් එක්වරම වෙලා ගත් අතර ඇය වියරුවෙන් මෙසේ කියන්නට විය. "තාමත් ඒ කසපාරවල්වල වේදනාව මගේ ඇඟේ පුපුරු ගසනවා. නමුත් ඊටත් වැඩිය වෛරයක් මගේ හිතේ උන් ගැන පුපුරු ගසනවා. . ඒකට මම උඹලගෙ ලේවලින් පලිගන්නවා. උඹගෙ අම්මලා මැරෙන විදිහට රිය අනතුරක නිර්මාණය කළේ මමයි .

හහ්. . . . . . ග්හ්. . . . . . .  හා. . . . . . .  දීපිය මගේ වළල්ල. ඒකෙ බලය අරන් මම හහ්. . . . . . ග්හ්. . . . . . .  හා. . . . . . .  හහ්. . . . . . ග්හ්. . . . . . .  හා. . . . . . .  උඹව මරනවා. ”

කියමින් ඇය ජෙනී වෙත කඩා පැන්නා ය.

ජෙනී මරලතෝනි නගන්නට පටන් ගත්තාය නමුත් ජෙනී හට යන්තම් සීරීමක් හෝ නොවූයේ බාර්බරාගේ දූරදිග බැලීමේ නුවණ නිසයි .

*    *    *    *

ඔවුන් එදින හවස කළ සාකච්ඡාවේදී බාර්බරා, පොතක කියවා තිබූ ආකාරයට ‘රිදී කුරුසයකින් අවතාරයකට කළ හැකි දේ ‘ යන වැදගත් කරුණ මිතුරන් හට හෙළි කරන ලදී.

කොයි මොහොතේ හෝ ඕනෑ වේවි කියා සිතී කුරුස සතර මිලට ගෙන මිතුරියන් අතර බෙදා දී තිබුණේ ඇය විසිනි.

*    *    *    *

එක්වරම අවතාරය ජෙනී ගේ ඇඟට පනිනවාත් සමග ම ඇගේ මිතුරියන් තිදෙනා (බාර්බරා ඇතුළු ව) බාර්බරා පෙර දී ලබා දුන් උපදෙස් අනුව කුරුස සතර මගින් අවතාරය විනාශ කර දැමුවේ ඒවායින් අවතාරයේ පපුවට ඇනීමෙනි. ඔවුන් පිටට අනිනවාත් සමගම මහළු කතගේ අවතාරය විනාශ වී ගියේ මෙසේ කියමිනි.

## “මම කවද හරි මේකේ පලිය ගන්නවා! “

*                    *                    *                    *

ජෙන්ක්ස් නැන්දාගේ මරණය පිළිබඳ පැමිණිලි ගොණුව තවමත් නොවිසිඳුණු ලිපි ගොනුවේ තැන්පත් කර ඇත. එය පොලිසියට තවමත් ගැටළුවක් වුවද, ‘සිව් දෙන හවුල ‘කණ්ඩායමේ සාමාජිකයින් නම් සත්‍ය කුමක්දැයි දැනගෙන අවසන් ය.

ජෙනීගේ නැන්දනියගේ අවමංගල උත්සවය ඉහත කී බිහිසුණු රැයට පසු දින පැවැත්වුණි. එහි වැඩ කටයුතු සියල්ල අවසන් වූ පසු දින ජෙනී තම බාප්පාගේ නිවසේ පදිංචියට ගියා ය.

ඔහුගේ නිවස පිහිටා තිබුණේද ජෙන්ක්ස් නැන්දාගේ නිවසට නුදුරිනි.

*                    *                    *                    *

ඇය දැන් බාප්පාගේ නිවසේ පදිංචියට පැමිණ දැන් මසක් පමණ ගත වී ඇත. එක් රැයක රාත්‍රී ආහාරයෙන් පසු දුරකතන ඇමතුමක් ආවේ ය. ඉහළ මාලයේ කාමරයක් හිමිව තිබූ ජෙනීට ද දුරකථනයේ ශබ්දය ඇසුණි. පුංචි අම්මා දුරකථනයේ රිසීවරයා අතට ගෙන මදක් අමතා” ජෙනී. . . . . . . ජෙනී. . . . . . . . පහළට එන්න ඔයාට මෙන්න කෝල් එකක්. . . . . . .” කියමින් අඬගැසුවා ය.

ජෙනී පහළ මාලයට පැමිණියේ ඇමතුම ගත් තැනැත්තා කවුරුන්දැයි සිතමිනි.

“හෙලෝ. . .”

“හෙලෝ ජෙනි මම පර්සි. මේ. . . . . හෙට රැස්වීමක් තියෙනවා කාලෙකින් තියන්නත් බැරි වුණා. .”

“ඇයි ඒ ? තව මොකක් හරි ත්‍රාසජනක ගමනක්ද?”

“හෙට කියන්නම් මෙහෙම කියන්න බෑ. මම තියන්නම් මට වැඩ වගයක් තියෙනවා බායි. . . . . ”

“බායි. ”

“ඇයි දුවේ?” එසේ ඇසුවේ පුංචි අම්මා ය.

“නෑ පුංචි . හෙට අපේ සිව් දෙන හවුලේ රැස්වීමක් තියෙනවලු. ඒකයි. . . . ” කියමින් ජෙනී දිව ගොස් ඇඳට පැන්නේ තවත් ත්‍රාසජනක ගමනක් හෙට දිනක් යෑමට බලාපොරොත්තුවෙනි. .

# නිමි.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට. ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප් නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි.එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසැලක් මුල්වීමෙන් අධියාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහි දී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරු භවතුන් දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතු ය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකි ය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි . මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ සමග ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි.තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන..

ව්‍යාපෘති නිර්මාතෘ

සම්බන්ධීකාරක,

සෙනවිරත්න මහ ලේකම්.